පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත

மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்

DEPARTMENT OF EDUCATION - NORTH CENTRAL PROVINCE

අවසාන වාර පරීක්ෂණය - 2022

නර්තනය - I , II

| ශ්‍රේණිය |
| --- |
| 11 |

පාසලේ නම: ..............................................................................................

ඇතුළත්වීමේ අංකය: ....................................

කාලය:පැය 3 යි.

## I කොටස

**ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

01. පහතරට නර්තන සම්ප්‍රදායේ සින්දු වන්නමක කොටස් ගණන,

i. 3 කි ii. 4 කි iii. 2 කි iv. 5 කි

02. උඩරට සම්ප්‍රදායේ වන්නමක් නටා අවසන් කරන කස්තිරම පහතරට හා සබරගමු සම්ප්‍රදායේ දී හඳුන්වන්නේ,

i. සුරල සහ අඩව්ව ලෙසය  ii. ඉරට්ටිය සහ සුරල ලෙසය

iii. කලාසම සහ සීරුමාරුව ලෙසය  iv. ඉරට්ටිය සහ කලාසම ලෙසය

03. ගැටබෙරය අයත් වනුයේ පංචතූර්ය වාදනයේ දී,

i. විතත භාණ්ඩයක් ලෙසය  ii. ආතත භාණ්ඩයක් ලෙසය

iii. විතතාතත භාණ්ඩයක් ලෙසය  iv. ඝණ භාණ්ඩයක් ලෙසය

04. උඩරට නර්තන සම්ප්‍රදායේ ගොඩ සරඹ සහ පා සරඹ පහතරට නර්තන සම්ප්‍රදායේදී හඳුන්වනු ලබන්නේ,

i. ඉලංගම් සරඹ - පාසරඹ යනුවෙනි

ii. දොඹින පද - පාසරඹ යනුවෙනි

iii. මණ්ඩි පද - දොඹින පද යනුවෙනි

iv. මණ්ඩි පද - ඉලංගම් සරඹ යනුවෙනි

05. තාලය ග්‍රහණය කරගන්නා ආකාර තුන මෙසේය.

i. සමගුණ, දෙගුණ, සිව්ගුණ

ii. අඩතිත, මධ්‍ය තිත, තාල තිත

iii. සමග්‍රහ, අවග්‍රහ, විෂම ග්‍රහ

iv. බර, හරඹ, කාඩිනම්

06. දේශීය නර්තන සම්ප්‍රදායන් තුනට අදාල ප්‍රධාන ශාන්ති කර්ම තුනෙහිම දක්නට ලැබෙන පොදු නර්තන අංගයකි,

i. යක්කම්  ii. වන්නම්

iii. හත් පදය  iv. දේව කෝල් පාඩුව

07. විනෝදාර්ථය, පූජාර්ථය හා සන්නිවේදන කාර්ය යන අරමුණු තුනම ඇතුලත්ව ප්‍රබන්ධ වූ ගැමි ගායනා විශේෂයකි,

i. ටීකා සීපද  ii. ආශිර්වාද කවි

iii. රබන් කවි  iv. හටන් කවි

08. රංගන ශිල්පියාගේ සාමාන්‍ය ස්වරූපය නොවෙනස් වන අයුරින් වෙස් ගැන්වීම සිදු කරනුයේ,

i. විකාර රූපී අංග රචනය ii. චරිතාංග අංග රචනය

iii. ස්වාභාවික අංග රචනය iv. ශෛලිගත අංග රචනය

09. චරිතාංග අංග රචනයක් සිදු කිරීමේදී අංග රචන ශිල්පියා ළඟ තිබිය යුතු වැදගත් අංගයකි,

i. චරිතය ඇතුලත් ඡායාරූප ii. නාට්‍ය පිටපත

iii. මූලික ආලේපන iv. විවිධ පින්සල්

10. යුධ ජයග්‍රහණයක දී විරෝධත්වය ප්‍රකාශ කිරීමයට වාදනය කරනුයේ,

i. මඟුල් බෙර ii. අණ බෙර

iii. රණ බෙර iv. වද බෙර

11. බෙර වාදන ශිල්පීන් දෙදෙනෙකු මුහුණට මුහුණලා වාදාත්මක ස්වරූපයෙන් වාදනය කරනුයේ,

i. මඟුල් බෙර ii. පිං බෙර

iii. යහන් බෙර iv. අතයා බෙර

12. ගැමි නර්තන අතුරෙන් ඝණ වාද්‍ය භාණ්ඩයක් අතැතිව ඉදිරිපත් කරන නැටුමකි,

i. ලී කෙලි ii. තාලම්

iii. පතුරු iv. බුම්මැඩි .... නැටුම්

13. නර්තන තරඟයකින් ජයග්‍රහණය කල විට ලැබෙන සතුට ප්‍රකාශ කිරීමෙන් පිළිඹිබු වන රසය,

i. අත්භූත රසය ii. වීර රසය

iii. විෂ්ම භාවය iv. ශෘංගාර රසය

14. ලක්ෂ්මි .............භූජ වාසා ................ යන කවිය,

i. හටන් කවියකි ii. පන්තේරු කවියකි

iii. වන්නමකි iv. ප්‍රශස්ති කවියකි

15. මහනුවර දළදා පෙරහැරෙහි දැකිය නොහැකි නර්තන අංගයක් වනුයේ,

i. වෙස් නැටුම ii. උඩැක්කි නැටුම

iii. චාමර නැටුම iv. වඩිගපටුන නැටුම

16. 'විමන සමග කෙහෙතු දැනා'යන කවි පදය අන්තර් ගත වන්නම වනුයේ,

i. මාත්‍රා 3 තාලයට නටන වෛරෝඩි වන්නම

ii. මාත්‍රා 2 + 3 තාලයට නටන තුරඟා වන්නම

iii. මාත්‍රා 4 තාලයට නටන වෛරෝඩි වන්නම

iv. මාත්‍රා 2 + 4 තාලයට නටන සැවුලා වන්නම

17. මාත්‍රා 2 + 2 + 3 (12/12/123) තාල රූපයට අයත් තාල සංකේත මෙසේ ය.

i. ^/^/ / ii. ////^ iii.^///^ iv ^/^/^

18. නර්තන කලාවේ නූතන ප්‍රවණතා අතර වඩාත්ම වැදගත් ප්‍රවණතාවක් වනුයේ,

i. රූපවාහිනි රියැලිටි වැඩසටහන්

ii. අධ්‍යාපනික ප්‍රවණතා

iii. ජාත්‍යන්තර සබඳතා නිසා ඇති වූ ප්‍රවණතා

iv. තාක්ෂණික දියුණුව නිසා ඇති වූ ප්‍රවණතා

19. කුඹි කථාව ළමා මුද්‍රා නාට්‍යයේ රංග වස්ත්‍රා හා පසුතල නිර්මාණය කරන ලද්දේ,

i. මහින්ද ඩයස් මහතා     ii. අංජලිකා චිත්‍රසේන මිය

iii. චිත්‍රසේන ඩයස් මහතා     iv. මහේෂ් උමගිලිය මහතා

20. සතර අභිනයට අයත් නොවන්නේ ,

i. ආංගික අභිනය     ii. ප්‍රාසාංගික අභිනය

iii. සාත්වික අභිනය     iv. ආහාර්ය අභිනය

- **පහත රූප සටහන් ඇසුරින් ප්‍රශ්න අංක 21 සිට 25 දක්වා පිළිතුරු සපයන්න.**

| උඩැක්කිය | ගැටබෙරය | තම්මැට්ටම | හොරණෑව |
|---|---|---|---|
|  |  |  |  |
| A රූපය | B රූපය | C රූපය | D රූපය |

21. සවරම් පටිය භාවිතා කරන වාද්‍ය භාණ්ඩයකි.

i. A රූපය   ii. B රූපය   iii. C රූපය   iv. D රූපය

22. අතීතයේ තූර්ය භාණ්ඩ නාමාවලි තුළ දක්නට ලැබෙන පොකුරු බෙරය නමින් හැඳින්වූ වාද්‍ය භාණ්ඩය

i. B රූපය   ii. D රූපය   iii. A රූපය   iv. C රූපය

23. හේවිසි වාදනයට මෙන්ම අතීතයේ කෝලම් නාටක සඳහාද යොදා ගත් වාද්‍ය භාණ්ඩයකි.

i. A රූපය   ii. B රූපය   iii. D රූපය   iv. C රූපය

24. 'සුරත් තට්ටුව' යන අංගය අයත් වනුයේ,

i. A රූපයටයි   ii. B රූපයටයි   iii. D රූපයටයි   iv. C රූපයටයි

25. සොකරි නාටකයට වන්නි ප්‍රදේශයේ වාදනය සඳහා වැඩි වශයෙන් භාවිතා කරයි.

i. C රූපයටයි   ii. B රූපයටයි   iii. A රූපයටයි   iv. D රූපයටයි

- **ප්‍රශ්න අංක 26 සිට 30 දක්වා වගුව ඇසුරින් පිළිතුරු සපයන්න.**

| පේළිය | A තීරුව | B තීරුව | C තීරුව | D තීරුව |
|---|---|---|---|---|
| I | ශාන්ති නිකේතනය | මිරැන්ඩා හේමලතා | අංජලිකා චිත්‍රසේන මිය | නලදමයන්ති |
| II | චිත්‍රා අල්ගම | පණිභාරත මහතා | සැළලිහිණිය | කේරල කලා මණ්ඩලම් |
| III | හින්දුස්ථානි සංගීතය | දවුල | වජිරා චිත්‍රසේන මිය | කර්ණාටක සංගීතය |
| IV | ස්වර්ණතිලකා | කරදිය | තම්මැට්ටම | මල්ලතෝල් නාරායන මෙනන් |

26. නර්තන අධ්‍යාපනයේ ප්‍රවර්ධනය සඳහා දායකත්වය ලබා දුන් නර්තන ශිල්පිණියගේ නම සඳහන් වන්නේ,

i. II පේළියේ A තීරුවේ ය.     ii. I පේළියේ B තීරුවේ ය.

iii. III පේළියේ C තීරුවේ ය.     iv. I පේළියේ C තීරුවේ ය.

27. එම නර්තන ශිල්පිනිය විසින් නිර්මාණය කරන ලද නෘත්‍ය නාට්‍ය නාටකය දැක්වෙන්නේ,

i. IV පේළියේ B තීරුවේ ය. ii. I පේළියේ D තීරුවේ ය.

iii. IV පේළියේ A තීරුවේ ය. iv. II පේළියේ C තීරුවේ ය.

28. මුද්‍රා නාට්‍ය ක්ෂේත්‍රයට ඉමහත් දායකත්වයක් ලබා දුන් ප්‍රවීණතම නර්තන ශිල්පිණිය වන්නේ,

i. III පේළියේ A තීරුවේ ය. ii. I පේළියේ B තීරුවේ ය.

iii. III පේළියේ C තීරුවේ ය. iv. I පේළියේ C තීරුවේ ය.

29. ප්‍රේම කුමාර එපිට වල මහතා නිර්මාණය කල මුද්‍රා නාට්‍යයක් ඇතුළත් වන්නේ,

i. IV පේළියේ A තීරුවේ ය. ii. IV පේළියේ B තීරුවේ ය.

iii. II පේළියේ C තීරුවේ ය. iv. I පේළියේ D තීරුවේ ය.

30. D තීරුවේ II, III, IV පේළි වල ඇතුලත් තොරතුරු හා සම්බන්ධ නර්තන සම්ප්‍රදාය ප්‍රචලිතව ඇත්තේ

i. දක්ෂිණ භාරතයේය. ii. දිල්ලියේය

iii. උත්තර භාරතයේය iv. මණිපුරි ප්‍රාන්තයේය

31. මෙම ඡායා රූපයෙන් දැක්වෙන නර්තන සම්ප්‍රදාය නම්



i. භරත ii. කථකාලි

iii. කථක් iv. මණිපුරි

32. එම නර්තන සම්ප්‍රදායේ නර්තන ශිල්පිණිය ගෙලට පළඳින මාලය

i. රාක්බඩි ii. වංගි

iii. අට්ටියල් iv. ඔට්ටියානම්

33. දේව පුරාවෘත්ත කතාවන් ඇසුරින් ගොඩනැගුණු භාරතීය නර්තන සම්ප්‍රදාය වනුයේ,

i. මණිපුරි ii. භරත

iii. කථක් iv. කථකලී

34. කේරල ප්‍රාන්ත රජකෙනෙක් වු කොට්ටාරක්කාර තාම්පුරණ් විසින් නිර්මාණය කළ නාට්‍ය වනුයේ,

i. රාමාට්ටම් ii. ක්‍රිෂ්ණාට්ටම්

iii. චක්කියාර්කුත්තු iv. මුඩියෙට්ටු

35. මණිපූරි නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන අවනද්ධ භාණ්ඩය හා තාලම්පොට හඳුන්වනුයේ,

i. පඛ්වාජ් - ඉලතාලම් ii. පුංග් - නට්ටුවාංගම්

iii. මෘදංගය - මංජිරා iv. පුංග් - මංජිරා නම්නි.

36. ''හනික වරෙව් කොල්ලනේ '' සහ '' මෙම ගිම්හාන ග්‍රීස්ම වු කාලේ '' යන ගීත,

i. වීථි නාට්‍ය ගීත වේ. ii. ගුවන් විදුලි නාට්‍ය ගීත වේ.

iii. වේදිකා නාට්‍ය ගීත වේ. iv. ටෙලි නාට්‍ය ගීත වේ.

37. වාසනා දිනෙහි මේක පාමු තුටින් සිතේ ගීතය

i. විදුර නූර්තිය ii. ධැලසන්න නාඩගම

iii. සිරිසඟබෝ නූර්තිය iv. ශ්‍රී වික්‍රම නූර්තියේ ය

38. කෝලම් නාටකයේ එන මානුෂ චරිත කීපයකි.

i. ලියනප්පු, පොලිස්, ගිරිදේවි     ii. නාගකන්‍යා, ආරච්චි, නොංචි

iii. සුරඹාවල්ලි, වඩිගපටුන, ඊරියකා     iv. ලියනප්පු, හේවාරාල, පොලිස්

39. 'පෙර සිට පැවත එන සිරිතට පොදිය බැද ගෙන' යන කවි පදය අයත් වන්නේ

i. මුදලි කෝලම     ii. ජස කෝලම

iii. අණබෙර කෝලම     iv. ලියනප්පු කෝලමට

40. සොකරි ගැමි නාටකයේ විකට චරිතයක් ලෙස හඳුන්වන්නේ,

i. හෙණ්වප්පු     ii .පරයා

iii. චුක්කිනියා     iv. ඩුංගුරුවා

- **පහත සඳහන් රූප සටහන් ඇසුරින් 41 සිට 45 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**


(i) රූපය


(ii) රූපය


(iii) රූපය


(iv) රූපය

41. 'කුමින් නම් රංග වස්ත්‍ර කොටස අයත්වනුයේ,

i. I රූපයට     ii. II රූපයට     iii. III රූපයට     iv. IV රූපයට

42. 'උල් උඩය' අයත් වන්නේ,

i. I රූපයට     ii. II රූපයට     iii. III රූපයට     iv. IV රූපයට

43. II රූපයෙන් දැක්වෙන නර්තන ශිල්පියා ඇතුලත් නර්තන සම්ප්‍රදාය

i. උඩරට නර්තනය     ii. පහතරට නර්තනය

iii. භාරතීය නර්තනය     iv. සබරගමු නර්තනය

44. පහතරට නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන ඇඳුම් කට්ටලයක් සහිත වන්නේ,

i. I රූපයේ     ii. II රූපයේ

iii. III රූපයේ     iv. IV රූපයේ

45. IV රූපයට අයත් ඇඳුම් කට්ටලයේ ඇතුලත් කොටසක් වන්නේ,

i. පාහිම්පත     ii. පොහොට්ටු පටිය

iii. පබළු හැට්ටය     iv. තෙල්මේ හැට්ටය

46. පාසල් අධ්‍යාපනයට නර්තන විෂයක් ලෙස ඇතුලත් කරන ලද්දේ,

i. 1972 වර්ෂයේ     ii. 1974 වර්ෂයේ

iii. 1936 වර්ෂයේ     iv. 1943 වර්ෂයේ

47. ඇම්බැක්ක දේවාලයේ ලී කෙලි නැටුමට අදාල කැටයම් අයත් වනුයේ,

i. ගම්පොල යුගය     ii. මහනුවර යුගය

iii. කෝට්ටේ යුගය     iv. කුරුණෑගල යුගය

48. පොලොන්නරු යුගයට අයත් ශිලා ලිපියක් වන්නේ

i. පාලමොට්ටායි ශිලා ලිපිය     ii. තෝනිගල ශිලා ලිපිය

iii පෙරිමියම් කුලම ශිලා ලිපිය     iv සැස්සේරුව ශිලා ලිපිය

49. ගැමි නැටුමක් ඉතා පහසුවෙන් හඳුනාගතහැකි සාධකයකි

i. ගැමි ගායනා තිබීමෙන් ii. සරල බව්න් යුක්ත වීමෙන්

iii. නර්තන චලන මගින් iv. උපකරණයක් අතැතිව නැටීමෙන්

50. අහස් ගැබ තුළ වෙනදා නොදුටු දීප්තිමත් වස්තුවක් දැකීමෙන් ඇසිපිය නොහෙලා ගල් ගැසුනාක් මෙන් බලා සිටීම තුලින්,

i. හාස භාවය ප්‍රදර්ශණය වේ. ii. භය භාවය ප්‍රදර්ශණය වේ.

iii. රතී භාවය ප්‍රදර්ශණය වේ. iv. විෂ්ම භාවය ප්‍රදර්ශණය වේ

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION - NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
|---|
| 11 |

අවසාන වාර පරීක්ෂණය - 2022
නර්තනය

පාසලේ නම: ......................................................................................................
ඇතුළත්වීමේ අංකය: ..................................

කාලය:පැය 3 යි.

- ❖ **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- ❖ **පළමුවන ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න 4 ක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**
- ❖ **සෑම ප්‍රශ්නයකටම ලකුණු 12 බැගින් හිමි වේ.**

**II කොටස**

01. සියලුම ප්‍රශ්න වලට සුදුසු පිළිතුරු ඔබගේ පිළිතුරු පත්‍රයේ අදාල ප්‍රශ්න අංක යොදා ඉදිරියෙන් ලියන්න.

i. රබන් පද වාදනය කරනුයේ .............................................. නි.

ii. තබ්ලාව / පඛ්වාජ් වාද්‍ය භාණ්ඩ භාවිතා කරනුයේ ............................................ නර්තන සම්ප්‍රදායටය.

iii. ග්‍රහ පංති කවි විශේෂය ගායනා කරනු ලබන්නේ .............................................. ශාන්තිකර්මයේ ය.

iv. සබරගමුව නර්තන සම්ප්‍රදායේ මුල්ම චලන අභ්‍යාසය ........................................ වශයෙන් නම් කෙරේ.

v. දෙවොල් මඩු ශාන්ති කර්මයේ කාන්තා චරිතයක් ඇතුලත් නර්තන අංගය .................................... නැටුම් වේ.

vi. කොහොඹා කංකාරිය ශාන්ති කර්මයේ පුරාවෘත්ත කථාවේ කුවේණියගේ චරිතය අලලා ........................................ නැටුම ගොඩ නැගී ඇත.

vii. කෝල්පාඩුව යන නර්තන අංගය ........................................... ශාන්ති කර්මයේ අන්තර්ගත නර්තන අංගයකි.

viii. ගැමි ගායනා අතර ......................................... හාස්‍ය හා උපාහාසය දනවන ගායනා විශේෂයකි.

ix. ..................................... වන්නම මාත්‍රා 4 තාලයට නටනු ලබන අතර සැවුලා වන්නම මාත්‍රා .................................... තාලයට නටනු ලබයි.

x. රත්නපුර, කුරුවිට වන ප්‍රදේශ වල බහුලව ................................... නර්තන සම්ප්‍රදාය ප්‍රචලිත අතර ............................... එහි ප්‍රධාන වාද්‍ය භාණ්ඩය වේ.

02.

i. මාත්‍රා 2 + 2 + 3 තුන්තිතේ තාලයට අයත් බෙර පදයක් ප්‍රස්ථාර කරන්න.

ii. මාත්‍රා 2 + 3 තාලයට අදාලව කවියක් ප්‍රස්ථාර කරන්න.

iii. මාත්‍රා දෙකේ තාලයට අයත් වන්නමක අඩව්වක් ප්‍රස්ථාර කරන්න.

03.

i. දේශීය නර්තන සම්ප්‍රදායන් 3 ට අදාල ප්‍රධාන ශාන්තිකර්ම තුනේම දක්නට ලැබෙන පොදු චාරිත්‍ර තුනක් සඳහන් කරන්න.

ii. මඟුල් බෙර වාදනය, පිං බෙර වාදනය, අත්‍යා බෙර වාදනය පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න.

iii. කොහොඹා කංකාරිය ශාන්ති කර්මයේ නර්තන අංගයක් හා නාට්‍යමය අවස්ථාවක් විස්තර කරන්න.

04.

i. ජීවන වෘත්තිය පාදක ගැමි නැටුම් 02 ක් නම් කර ඊට අදාල එක් කවියක් ලියන්න.

ii. කෝලම් ගැමි නාටකයේ එක් චරිතයකට අදාල කවියක් ලියා එයින් කියවෙන චරිතයේ ස්වභාවය පැහැදිලි කරන්න.

iii. සොකරි නාටකයේ කථා පුවත කෙටියෙන් ලියා දක්වන්න.

05.

i. පොළොන්නරුව යුගයේ නර්තන කලාව පැවති බවට ශෙල් ලිපියක සඳහන් සාධකයක් ඇසුරින් පෙන්වා දෙන්න.

ii. ගම්පොල යුගයට අයත් පුරා විද්‍යාත්මක මූලාශ්‍රයක් ඇසුරින් එකල නර්තන කලාවට භාරතීය අභාෂය ලබා ඇති ආකාරය පැහැදිලි කරන්න.

iii. ආගමික පුද පූජා සඳහා නර්තනය යොදාගෙන තිබු ආකාරය දේශාටන වාර්තාවක් ඇසුරින් පැහැදිලි කරන්න.

06.

i. භාරතීය නර්තන සම්ප්‍රදායන් හතර නම් කරන්න.

ii. භරත නාට්‍ය සම්ප්‍රදාය හා මණිපූරි නර්තනය ප්‍රචලිත ප්‍රදේශ දෙක බැගින් ලියන්න.

iii. භාරතීය නර්තන සම්ප්‍රදායන් හතරේ වාද්‍ය භාණ්ඩ වගුවක දක්වන්න.

07.

i. රූපවාහිනියෙන් විකාශනය වන නර්තන තරඟාවලි දෙකක් නම් කරන්න.

ii. එකී නර්තන තරඟාවලි මඟින් අධ්‍යාපනික වශයෙන් ඔබට ලැබෙන පිටිවහල පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.



LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න